කැලණිය විශ්වවිද්‍යාලය
මානවශාස්ත්‍ර පීඨය - වාග්විද්‍යා අංශය

# භාෂා පරිවර්තන සහ භාෂණ පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව
# 2024/2025 වර්ෂය සඳහා අයදුම්පත් කැඳවීම

ඉහත සඳහන් පාඨමාලාව සඳහා අපේක්ෂකයන් ලියාපදිංචි කරගැනීම සඳහා 2024 ජූලි මස 28 සිට 2024 අගෝස්තු මස 31 දින තෙක් අයදුම්පත් භාරගැනේ.

මෙය භාෂා පරිවර්තනය සහ භාෂණ පරිවර්තනය පිළිබඳ සෛද්ධාන්තික දැනුම සහ ප්‍රායෝගික පුහුණුව ලබාදීමට සුදුසු වන පරිදි සකස් කරන ලද පාඨමාලාවකි.

**පාඨමාලාවේ සංයුතිය:**

I දෙමළ - සිංහල පරිවර්තන පාඨමාලාව (සිංහල සහ දෙමළ භාෂා දැනුම ඇති අපේක්ෂකයන්ට)
II ඉංග්‍රීසි - සිංහල පරිවර්තන පාඨමාලාව (ඉංග්‍රීසි සහ සිංහල භාෂා දැනුම ඇති අපේක්ෂකයන්ට)

**පාඨමාලා කාලය:** අධ්‍යයන වර්ෂ එකකි. සෙනසුරාදා පෙරවරු 9.00 සිට පස්වරු 4.00 දක්වා දේශන පැවැත්වේ. දේශන කැලණිය විශ්වවිද්‍යාල පරිශ්‍රයේ දී (onsite) පැවැත්වෙන අතර, අවශ්‍යතාව අනුව ඇතැම් දේශන මාර්ගගත ක්‍රමයට (online) පැවැත්වෙනු ඇත.

**පාඨමාලා ගාස්තුව:** රු. 70,000/= කි. (රුපියල් හැත්තෑ දහසකි)
පළමු වැනි වාරිකය වන රුපියල් 40,000.00ක මුදල ඇතුළත් වීමේ දී ගෙවිය යුතු අතර, දෙවැනි වාරිකය වන රුපියල් 30,000.00ක මුදල මුල් මාස තුන ඇතුළත ගෙවිය යුතු ය.

**අයදුම් කිරීම සඳහා අවම සුදුසුකම්:** අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් සමත් වීම හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ සේවා අවශ්‍යතාව අනුව වසර 10ක සේවා පළපුරුද්ද

**පාඨමාලාවේ ආරම්භය:** 2024 ඔක්තෝබර්

**අයදුම්පත්‍ර ගාස්තුව:** රු.750.00කි. මාර්ගගත අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමෙන් පසු ව ලැබෙන රිසිට් පතෙහි සඳහන් ගිණුම් අංකයට ගාස්තුව ගෙවිය යුතු ය.

**අයදුම්පත්‍රය භාරදෙන ආකාරය:** https://hu.kln.ac.lk/depts/linguistics/ වෙබ් පිටුවෙහි පළ කොට ඇති මාර්ගගත අයදුම්පත්‍රය (online application) සම්පූර්ණ කිරීමෙන් පසු ව එහි මුද්‍රිත පිටපතක් සහ මහජන බැංකුවට අයදුම් පත්‍ර ගාස්තුව ගෙවා ලබාගත් රිසිට් පත සමග උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, උසස් පෙළ විභාග සහතිකය යන ලේඛනයන්හි පිටපත් 2024 අගෝස්තු මස 31 දින හෝ එයට පෙර ලැබෙන සේ **සම්බන්ධීකාරක, භාෂා පරිවර්තන සහ භාෂණ පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව, වාග්විද්‍යා අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, කවරයේ ඉහළ වම් කෙළවරේ **"භාෂා පරිවර්තන සහ භාෂණ පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත්‍රය - 2024/2025"** යනුවෙන් සඳහන් කළ යුතු ය.

- බඳවා ගනු ලබන විද්‍යාර්ථීන් සංඛ්‍යාව සීමාසහිත බැවින්, අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැකි ය. අයදුම්පත් ලැබෙන අනුපිළිවෙළ අනුව ප්‍රමුඛතාව හිමි වේ.

- පාඨමාලාව සම්බන්ධයෙන් වැඩි විස්තර සඳහා 0112 908 786 දුරකථන අංකයෙන් වාග්විද්‍යා අංශය අමතන්න. නැත හොත්, https://hu.kln.ac.lk/depts/linguistics/ සබැඳිය ඔස්සේ වාග්විද්‍යා අංශයේ වෙබ් අඩවියට පිවිසෙන්න.

ලේඛකාධිකාරී
කැලණිය විශ්වවිද්‍යාලය
2024.07.28